# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
# Co-operative Employees Commission (Southern Province)
සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | SP/CEC/1/O/5 | ඔබේ අංකය<br>உனது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.01.12 |

චක්‍රලේඛ අංක 02/2024

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>2024.05.01 දිනට පෙර විශ්‍රාම ලබන කොමිෂන් සභාවේ අනුමත නොවූ සමූපකාර සේවකයින්ට සහන සැලසීම.</u>**

දකුණු පළාත තුළ සමූපකාර සමිතිවල දීර්ඝකාලයක් සේවය කර ස්ථිර කිරීම සඳහා මූලික සුදුසුකම් සපුරා නොමැති 2024.05.01 දිනට පෙර විශ්‍රාම ලබන සමූපකාර සේවකයන්ට සහන සැලසීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. මෙම චක්‍රලේඛය මගින් සහන ඉල්ලා සිටීම සඳහා පහත කොන්දේසි අදාල වේ.

I. 02/2022 චක්‍රලේඛය මගින් බඳවා ගැනීම සඳහා දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ නොවීම.

II. 02/2022 චක්‍රලේඛයට පසුව පිරිස්බල තක්සේරුව අනුමත කර තිබීම.

III. මෙම චක්‍ර ලේඛය නිකුත් කරන දිනයට අවම වශයෙන් වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. 2024.05.01 දින හෝ ඊට පෙර වයස අවු.60 සම්පූර්ණ වීම.

V. සමිතියේ සේවයට බඳවා ගන්නා දිනට වයස අවුරුදු 45 ඉක්මවා නොතිබීම.

03. ඉහත 02 වගන්තියෙහි සඳහන් කොන්දේසි සම්පූර්ණ කරන සේවකයින් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ස්ථිර කිරීම සඳහා වන අයදුම්පත් මෙහි උපලේඛණ 01 ලෙස සඳහන් ඉල්ලීම් ද ඇතුලත්ව සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල /කාරක සභා තීරණයද සහිතව 2024.03.30 දිනට පෙර මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කල යුතුය.

04. එසේ ඉදිරිපත් කරන ගොණුව කොමිෂන් සභා අනුමැතියට සේවකයින්ගේ ගොණු ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ ලෙස නිකුත් කර ඇති 04/2021 චක්‍රලේඛය අනුව කොමිෂන් සභාවට ඉදිරිපත් කල යුතුය.


ලේකම් / செயலாளர் / Secretary – 091-2232794
පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer – 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax – 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site – www.cec.sp.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail – empcommicoopsp@sltnet.lk

05. දැනට සමිතිවල ස්ථිර සේවයේ නිරත 2022.05.01 දිනට පෙර සමිතිවල ස්ථිර සේවයට බඳවා ගත් එහෙත් කොමිෂන් සභා අනුමැතිය සඳහා ප්‍රමාණවත් සුදුසුකම් නොමැති සේවකයන්ට සහන සැලසීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසමින් පවතින අතර,එය කඩිනමින් ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

06. 02/2022 චක්‍රලේඛය නිකුත් කිරීමෙන් අනතුරුව එහි සඳහන් මූලික සුදුසුකම් සපුරා නොමැති කිසිදු සේවකයකු සමිතියක සේවය සඳහා බඳවා නොගත යුතුය. 2022.05.01 දිනෙන් පසු සමිතිවල සේවයට බැඳුනු 02/2022 චක්‍ර ලේඛයෙහි සඳහන් සුදුසුකම් සපුරා නොමැති කිසිදු සේවකයකු අනුමත කිරීම සඳහා කොමිෂන් සභාවෙන් ඉල්ලීම් නොකරන මෙන් වැඩිදුරටත් දන්වමි.

07. මෙම චක්‍රලේඛ විධිවිධාන 2024.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

2024.01.12

ජයන්ත ජී. ලියනගේ.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ජයන්ත ජී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

පිටපත -

1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන …….. සමූපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමූ.සං.ප්‍රා. නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා
3. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට.

උපලේඛණ 01

**සමිතියේ නම:**

| නම | තනතුර | පිරිස්බල තක්සේරුව අනුමත කල දිනය | සමිතියේ සේවයට බැදුනු දිනය | 2024.01.01 දිනට සේවා කාලය | සමිතියේ සේවයට බැදුනු දිනට වයස | 2024.05.01 දිනට වයස |
|---|---|---|---|---|---|---|
| | | | | | | |